**වෙස්ට් කෝස්ට් පවර් (පුද්ගලික) සමාගම - 2023/2024**

**-----------------------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

වෙස්ට් කෝස්ට් පවර් (පුද්ගලික) සමාගමේ ("සමාගම") 2024 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ලාභ හා අලාභ සහ වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය, අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්ති තොරතුරු වලින් සමන්විත 2024 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

සමාගමේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2024 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නාවූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 කරුණ අවධාරණය කිරීම

සමාගම සහ ලංකා විදුලිබල මණ්ඩලය අතර, මෙහෙයුම් හා සම්බන්ධ බිල්පත් නිරවුල් කිරීමට අදාළව, දිගුකාලීනව පැවති එකඟ නොවීම් විසඳීම හේතුවෙන්, පෙර වර්ෂයන් සඳහා සිදුකර තිබුණු ගැලපීම හෙළි කරනු ලබන මූල්‍ය ප්‍රකාශනවල 25 වන සටහන වෙත මම අවධානය යොමු කරවමි. මෙම ගැලපීම් 2019 වර්ෂය දක්වා විහිදෙන අතර, ලංකා විදුලිබල මණ්ඩලය විසින් බිල්පත් නිරවුල් කිරීමේදී, වෙනස් පරාමිති අගයන් භාවිතා කිරීම, ඉන්ධන බලශක්ති අනුපාතයේ (FER) පැවති විෂමතාවන්, ඩීසල් ආශ්‍රිත මෙහෙයුම් ගැටළු, ඉන්ධන නොමැතිවීම නිසා ද්‍රවශීලතා හානිපූර්ණ ගාස්තු පැනවීම, විදුලිය මිළදී ගැනීමේ ගැටළු, එකතු කල අගය මත බදු ප්‍රතිපූරණය කිරීම, සහ ප්‍රමාද පොලී ගණනය කිරීම් සඳහා භාවිතා කරන ක්‍රමවේද, වැනි කරුණු මෙම එකඟ නොවීම් සඳහා පාදක වී තිබුණි. සටහන පරිදි, මෙම එකඟ නොවීම් සම්බන්ධයෙන් රු. 18,236,009,674 ක හානිකරණය වෙන් කිරීමක් ගිණුම් වල හඳුනාගෙන තිබුණ ද, තවදුරටත්, පෙර කාල පරිච්ඡේද සඳහා, ආදායම අධිගණන වී තිබීම හේතුවෙන්, තවත් රු. 22,074,233,110 ක ගැලපීමක් සිදු කර තිබුණි. එ අනුව, අදාළ මූල්‍ය වාර්තාකරණ රාමුවට අනුකූලව, පෙර කාල පරිච්ඡේද ගැලපීම් සඳහා සංසන්දනාත්මක සංඛ්‍යා නැවත ප්‍රකාශ කර ඇත. මෙම හේතුවෙන් මගේ මතය විකරණය කර නොමැත.

### 1.4 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන්

තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබලවන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- සමාගමේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්වයන් හේතුවෙන් අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී.

ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සමාගමේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව,

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සමාගම ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව, සහ

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගෙවිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ලංකා විදුලිබල මණ්ඩලයෙන් (ලංවිම) විදුලිය මිළදී ගැනීම වෙනුවෙන්, ගෙවිය යුතු රු.2,600,147,652 ක ශේෂයක්, 2024 මාර්තු 31 දින වන විටත් ගිණුම් වල පැවැති අතර, විදුලිය සඳහා ලංවිම වෙතින් විදුලි බිල්පත් නොලැබීම හේතුවෙන්, ඇස්තමේන්තු අගයක් මත පදනම්ව එය ගණනය කර ගිණුම්ගත කර තිබුණි. | 2022 දෙසැම්බර් මාසයේ සිට වෙස්ට් කෝස්ට් පවර් (පුද්ගලික) සමාගම වෙත විදුලි බිල්පත් ලැබී නොමැති අතර, ගණනය කළ අගයන් මත පදනම්ව වියදම් වාර්තා කර ඇත. | අදාළ පාර්ශ්වයන්ගේ සම්බන්ධීකරණයෙන් ගැටළු විසඳීමට පියවර ගත යුතුය. |

**1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) 2021 නොවැම්බර් 17 දින නිකුත් කරන ලද රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 01/2021, රාජ්‍ය ව්‍යවසායන් සඳහා වන මෙහෙයුම් අත්පොත, | | | |
| (i) 3.1 වගන්තිය (i) | | | |
| | රජය සතු සියලුම ව්‍යවසායන් තම සේවක සංඛ්‍යාව සහ වේතන සඳහා මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබාගත යුතුය. කෙසේ වෙතත්, සමාගම මෙම අවශ්‍යතාවයට අනුකූල වීමට අපොහොසත් වී තිබුණි. | මෙම සමාගම යුගදනවි මෙගාවොට් 300 ක ඒකාබද්ධ චක්‍රීය බලාගාරය හිමිකර ගැනීම සඳහා පිහිටුවන ලද තනි අරමුණක් සහිතව පිහිටුවා ඇති සමාගමකි. ලංකා විදුලිබල මණ්ඩලය සමඟ අත්සන් කරන ලද විදුලිබල මිලදී ගැනීමේ ගිවිසුමේ (PPA) අවශ්‍යතාවයන්ට අනුව, බලාගාරයේ සම්පූර්ණ ක්‍රියාකාරිත්වය කොන්ත්‍රාත්කරුවකුට පවරා ඇත. එබැවින්, සමාගමට සේවකයින් ලෙස සිටින්නේ ප්‍රධාන විධායක නිලධාරී, ගණකාධිකාරී සහ සහකාර ගණකාධිකාරී පමණි. ඔවුන්ගේ වේතන සමාගමේ අයවැය පාලන ක්‍රියාවලියට අනුව මණ්ඩලය විසින් අනුමත කර ඇත. | අත්පොතෙහි විධිවිධානවලට අනුකූල විය යුතුය |
| (ii) 3.2 වගන්තිය (i) | රජය සතු ව්‍යවසායන්, සේවක තනතුරු, බඳවා ගැනීමේ යෝජනා ක්‍රමය (SOR), වැටුප් ව්‍යුහය සහ දීමනා ඇතුළු අනුමත තනතුරු වලට අදාළ ඉල්ලීම්, අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය සහ රේඛීය අමාත්‍යාංශ නිර්දේශ සහිතව, කළමනාකරණ | තනි අරමුණක් සහිතව පිහිටුවා ඇති ආයතනයක් හේතුවෙන් අනුමත තනතුරු සම්බන්ධයෙන් කිසිදු ඉල්ලීමක් සිදු කිරීමට අවශ්‍ය නොවේ. | අත්පොතෙහි විධිවිධානවලට අනුකූල විය යුතුය |

| | | | |
|---|---|---|---|
| | සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අනුමැතිය සඳහා ඉදිරිපත් කළ යුතුය. කෙසේ වෙතත්, සමාගම මෙම අවශ්‍යතාවයට අනුකූල වීමට අපොහොසත් වී තිබුණි. | | |
| (iii) 6.6 වගන්තිය | මුදල් වර්ෂය අවසන් වී මාස පහක් (5) ඇතුළත වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතුය. කෙසේ වෙතත්, සමාගම ආරම්භයේ සිටම වාර්ෂික වාර්තාව සභාගත කර නොතිබුණි. | වෙස්ට් කෝස්ට් පවර් (පුද්ගලික) සමාගම දැනට වාර්ෂික වාර්තාව සකස් කරමින් සිටින අතර, එය විගණනයට ලබා දිය හැකිය. | අත්පොතෙහි විධිවිධානවලට අනුකූල විය යුතුය |
| (iv) වගන්තිය 7.5,7.2 සහ 7.3 | ප්‍රධාන කාර්යසාධන දර්ශක (KPIs) හඳුනාගෙන තිබිය යුතු අතර, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ක්‍රියාකාරී සැලැස්මට සහ අයවැයට එරෙහිව ප්‍රධාන කාර්යසාධන දර්ශක වරින් වර සමාලෝචනය කළ යුතු අතර එමඟින් සැබෑ කාර්යසාධනය අපේක්ෂිත ප්‍රධාන කාර්යසාධන දර්ශක සමඟ අනුකූල වන බව සහතික කළ යුතුය. කෙසේ වෙතත්, සමාගම මෙම අවශ්‍යතාවයට අනුකූල වීමට අපොහොසත් වී තිබුණි. | මහා භාණ්ඩාගාරය සමාගම තුළ කිසිදු අරමුදලක් ආයෝජනය කර නොමැති අතර, එහි මැදිහත්වීම සිදු කර ඇත්තේ විදේශීය ණය සම්පූර්ණයෙන්ම ගෙවා දැමීම මගින් විදුලි බලාගාරයට අවශ්‍ය මූල්‍යකරණ පහසුකම් ලබා ගැනීමේ අරමුණින් පමණි. කෙසේ වෙතත්, මෙම තොරතුරු කළමනාකාරිත්වය විසින් අධ්‍යක්ෂ මණ්ඩලයට නිතිපතා සපයනු ලැබේ. | අත්පොතෙහි විධිවිධානවලට අනුකූල විය යුතුය |
| (iv) වගන්තිය 7.5 | රජය සතු ව්‍යවසායයන් විසින් මාසික, කාර්තුමය සහ වාර්ෂික කාර්යසාධන වාර්තා අදාළ අකෘතියෙන් යුතුව අවශ්‍ය පරිදි රේඛීය අමාත්‍යාංශයට සහ මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කළ යුතුය. කෙසේ වෙතත්, සමාගම මෙම අවශ්‍යතාවයට අනුකූල වීමට අපොහොසත් වී තිබුණි. | මහා භාණ්ඩාගාරය සමාගම තුළ කිසිදු අරමුදලක් ආයෝජනය කර නොමැති අතර, එහි මැදිහත්වීම සිදු කර ඇත්තේ විදේශීය ණය සම්පූර්ණයෙන්ම ගෙවා දැමීම මගින් විදුලි බලාගාරයට අවශ්‍ය මූල්‍යකරණ පහසුකම් ලබා ගැනීමේ අරමුණින් පමණි. කෙසේ වෙතත්, මෙම තොරතුරු කළමනාකාරිත්වය විසින් අධ්‍යක්ෂ මණ්ඩලයට නිතිපතා සපයනු ලැබේ. | අත්පොතෙහි විධිවිධානවලට අනුකූල විය යුතුය |

| | | | |
|---|---|---|---|
| (ආ) 2021 නොවැම්බර් 17 දිනැති රජය සතු ව්‍යවසායන් සඳහා ආයතනික පාලනය පිළිබඳ මාර්ගෝපදේශයේ 2.3 වගන්තිය | ක්‍රියාකාරී සැලැස්ම සහ වාර්ෂික අයවැය සමඟ අවසන් කරන ලද උපායමාර්ගික සැලැස්ම රේඛීය අමාත්‍යාංශයේ ලේකම් හරහා රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ට, හෝ ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත අදාළ වන පරිදි ඉදිරිපත් කළ යුතුය. කෙසේ වෙතත්, සමාගම මෙම අවශ්‍යතාවයට අනුකූල වීමට අපොහොසත් විය. | මෙම සමාගම පිහිටුවා ඇත්තේ ජාතික විදුලිබල පද්ධතියට විදුලිය ලබා දීමෙන් එහි කොටස් හිමියන්ට ලාභ උපයා දීම සඳහා ය. පසුගිය වසර 14 තුළ මෙම ඉලක්කය සපුරා ඇත. එබැවින්, දැනටමත් එකඟ වී ඇති ගිවිසුම් බැඳීම් සඳහා උපායමාර්ගික සැලැස්මක් සකස් කිරීම අවශ්‍ය නොවේ. | අත්පොතෙහි විධිවිධානවලට අනුකූල විය යුතුය |
| (ඇ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40 (i) වගන්තිය සහ 2021 නොවැම්බර් 19 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 01/2021 යටතේ නිකුත් කරන ලද රාජ්‍ය ව්‍යවසායන් සඳහා ආයතනික පාලනය පිළිබඳ මාර්ගෝපදේශයේ 4.4 වගන්තිය. | රාජ්‍ය ව්‍යවසායන් සඳහා විගණන කමිටුව හරහා මණ්ඩලයට පමණක් වාර්තා කරන අභ්‍යන්තර විගණකවරයෙකු සිටිය යුතුය. කෙසේ වෙතත්, සමාගම සඳහා අභ්‍යන්තර විගණකවරයෙකු පත් කර නොමැති බව නිරීක්ෂණය විය. | මෙම අවශ්‍යතාවයට අනුකූල වීම සඳහා වෙස්ට් කෝස්ට් පවර් (පුද්ගලික) සමාගම විසින් විගණන කමිටුවක් පිහිටුවා ඇත. ව්‍යවස්ථාපිත විගණනය මගින් මෙම ක්‍රියා පටිපාටි සහ අයවැය සඳහා අනුකූල වීම ආවරණය කරයි. සමාගමේ මුළු කාර්ය මණ්ඩලයම පුද්ගලයින් තිදෙනෙකුට සීමා වන අතර, සමාගම වගකිව යුත්තේ ඛනිජ තෙල් නීතිගත සංස්ථාව වෙතින් ඉන්ධන තොග වශයෙන් මිලදී ගැනීම, රසායනික ද්‍රව්‍ය සහ වාර්ෂික ව්‍යවස්ථාපිත ගෙවීම් සඳහා පමණි. | අත්පොතෙහි විධිවිධානවලට අනුකූල විය යුතුය |
| (ඇ) 2022 අගෝස්තු 08 දින නිකුත් කරන ලද රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 04/2022 හි 2.7 වගන්තිය. | ඒ අනුව සියලුම ආකාරයේ අනුග්‍රාහකත්ව, පරිත්‍යාග, ආයතනික සමාජ වගකීම් (CSR) වියදම් සහ ව්‍යාපාර ආශ්‍රිත නොවන ප්‍රවර්ධන වියදම් අත්හිටුවා තිබුණි. කෙසේ වෙතත්, සමාගම සමාලෝචිත වර්ෂය සඳහා රු. 5,511,595 ක පරිත්‍යාග ලබා දී තිබුණි | අයවැය ලේඛනයෙන් ආයතනික සමාජ වගකීම් වියදම් අනුමත කර ඇත. | අත්පොතෙහි විධිවිධානවලට අනුකූල විය යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රුපියල් මිලියන 19,776 ක ලාභයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ලාභය රුපියල් මිලියන 14,**641** ක් වියඑ් අනුව ., මූල්‍ය ප්‍රතිඵලයෙහි රුපියල් මිලියන **5,135** ක වර්ධනයක් නිරීක්ෂණය විය .දළ ලාභය රු. මිලියන 2,990 කින් වැඩිවීම හා මූල්‍ය වියදම් රුපියල් මිලියන 4,279 කින් අඩුවීම මේ සඳහා ප්‍රධාන හේතු විය.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

අ. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ආදායම සියයට 16.7 කින් ඉහළ ගොස් තිබුණි. ඊට සමගාමීව විකුණුම් පිරිවැය සියයට 17.6 කින් ඉහළ ගොස් තිබුණි.

ආ. සමාගමේ මූල්‍ය ආදායම සියයට 32.2 කින් අඩු වී ඇති අතර සමාගමේ මූල්‍ය පිරිවැය සියයට 66.7 කින් පහළ ගොස් ඇත.

### 2.3 අනුපාත විශ්ලේෂණය

අ. සමාගමේ දළ ලාභ අනුපාතය පෙර වසරට සාපේක්ෂව සියයට 27.5 සිට සියයට 26.9 දක්වා අඩු වී ඇති අතර පෙර වසරට සාපේක්ෂව ශුද්ධ ලාභ අනුපාතය සියයට 19.4 සිට සියයට 22.5 දක්වා වැඩි වී ඇත.

ආ. පෙර වසරට සාපේක්ෂව හිමිකම් මත ප්‍රතිලාභය සියයට 22.4 සිට සියයට 20.8 දක්වා වැඩි වී ඇත.

ඇ. සමාගමේ ජංගම අනුපාතය පෙර වසරට සාපේක්ෂව 1.4 සිට 1.8 දක්වා වැඩි වී ඇත.

## 3 මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ලක්දනවි ලිමිටඩ් සහ සමාගම අතර ඇති කර ගෙන තිබුණු මෙහෙයුම් හා නඩත්තු ගිවිසුමේ 4.2 (viii) සහ (ix) වගන්තිවලට අනුව, "ගැණුම්කරුට ඉන්වොයිසිය ලැබී දින 15 ක් ඇතුළත සැපයුම්කරුගේ ඉන්වොයිසිය මත ගෙවීම සිදු කළ යුතු විය. නියමිත දිනට පසු දින හතකට පසුව සැපයුම්කරුට ගෙවීම සිදු කරනු ලැබේ නම්, මූලික අනුපාතයට වඩා සියයට 2 ක අනුපාතයකින් පොලියක් අය කෙරේ". යනුවෙන් දක්වා තිබුණි. ඒ අනුව, සමාලෝචිත වර්ෂය තුළ සමාගම විසින් ලක්දනවි ලිමිටඩ් වෙත ප්‍රමාද පොලී ලෙස රු.142,318,849 ක මුදලක් ගෙවා තිබූ අතර, එසේ මුදල් ගෙවීම සමාගමට ඵලදායී නොවන ලෙස බලපා තිබුණි. | ලංකා විදුලිබල මණ්ඩලය වෙතින් අයවිය යුතු මුදල් ලැබීම් සීමා වීම හේතුවෙන් ලක්දනවි සමාගමට මෙහෙයුම් සහ කළමනාකරණ වියදම් ගෙවීම ප්‍රමාද විය. | ලක්දනවි ලිමිටඩ් සහ සමාගම අතර ඇති කර ගෙන තිබෙන මෙහෙයුම් හා නඩත්තු ගිවිසුමට අනුකූලව ප්‍රමාද පොලී පිරිවැය ඇතිවීම වැළැක්වීම සඳහා කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ඉන්ධන සැපයුම් ගිවිසුමේ 5.2.1 වගන්තියට අනුව, "ගිවිසුමට අනුව ඉන්ධන බෙදා හැරීම සිදු කළ දෙවන සතියෙන් පසු සතියේ සිට සහ ඉන් පසු සෑම දෙසතියකටම වරක්, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව (CPC) විසින් සමාගමට ශ්‍රී ලංකා රුපියලින් ඉන්වොයිසියක් ඉදිරිපත් කළ යුතු අතර, එවැනි ඉන්වොයිසියක් ලැබුණු දින සිට දින හතක් ඇතුළත සමාගම විසින් අදාල මුදල CPC වෙත ගෙවිය යුතුය." ඒ අනුව සමාලෝචිත වර්ෂය තුළ, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් රු.2,028,220,528 ක ප්‍රමාද පොලී මුදලක් අය කර ඇති බව නිරීක්ෂණය විය. මෙසේ මුදල් ගෙවීම් ප්‍රමාද වීම සමාගමට එළදායී නොවන ලෙස බලපා තිබුණි. | ලංකා විදුලිබල මණ්ඩලය වෙතින් අයවිය යුතු මුදල් ලැබීම් සීමා වීම හේතුවෙන් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට කරනු ලබන ගෙවීම් ප්‍රමාද විය. | ඉන්ධන සැපයුම් ගිවිසුමේ 5.2.1 වගන්තිය අනුකූල ප්‍රමාද පොලී පිරිවැය ඇතිවීම, වැළැක්වීම සඳහා කටයුතු කල යුතුය. |

3.2 **ප්‍රසම්පාදන කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාගම ප්‍රසම්පාදන කටයුතු සඳහා සමාගම විසින්ම සකස් කරන ලද ප්‍රසම්පාදන අත්පොතක් අනුගමනය කරන අතර, එය අදාළ අධිකාරිය (ජාතික ප්‍රසම්පාදන නියෝජ්‍යායතනය) විසින් අනුමත කර නොතිබූ අතර 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයද අනුගමනය කර නොතිබුණි. සමාලෝචිත වර්ෂය තුළ සමාගම සතුව ඇති සම්පාදන අත්පොත අනුගමනය කරමින් රු. මිලියන 1,206 ක භාණ්ඩ හා වැඩ ප්‍රසම්පාදනය කර තිබුණි. | වෙස්ට් කෝස්ට් පවර් (පුද්ගලික) සමාගමේ ක්‍රියා පටිපාටි අත්පොත අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර ඇත. බලශක්ති මිලදී ගැනීමේ ගිවිසුමට අනුව, සමාගම විසින් නිශ්චිත Availability අගයක් පවත්වා ගෙන යාමට බැඳී සිටින අතර, නොඑසේනම් දඩ මුදලක් ගෙවීමට සිදු වේ. එබැවින්, වෙස්ට් කෝස්ට් පවර් (පුද්ගලික) සමාගම විසින් අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කර ඇති ක්‍රියා පටිපාටි අත්පොතක් අනුගමනය කර ඇත. | එම ක්‍රියා පටිපාටි අත්පොතෙහි විධිවිධානවලට අනුකූල විය යුතුය. |

4 **ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

**1.1** **තිරසාර සංවර්ධන අරමුණු**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| එක්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධන ඉලක්ක (SDG) පිළිබඳ "2030 න්‍යාය පත්‍රයට" අනුකූලව, සියලුම රාජ්‍ය ආයතන එහි විෂය පථය යටතේ ඉලක්ක සහ කාර්යයන් ක්‍රියාත්මක කිරීමේදී දායක විය යුතුය. | මෙම සමාගම ජාතික විදුලිබල පද්ධතියට විදුලිය සැපයීමෙන් එහි කොටස් හිමියන්ට ලාභ උපයා ගැනීම සඳහා ස්ථාපිත කරන ලදී. | එක්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධන |

| | | |
|---|---|---|
| කෙසේ වෙතත්, සමාගම තිරසාර සංවර්ධන ඉලක්ක, සාක්ෂාත් කරගත යුතු ඉලක්ක සහ ප්‍රගතිය මැනීම සඳහා සුදුසු දර්ශක හඳුනාගෙන නොතිබුණි. | පසුගිය වසර 14 තුළ මෙම ඉලක්කය සාර්ථකව සාක්ෂාත් කර ගෙන ඇත. එබැවින්, SDGs සමඟ පෙළගැස්වීමේදී එවැනි ඉලක්ක සහ ක්‍රියාත්මක කිරීම් සකස් කිරීම අවශ්‍ය නොවේ. | ඉලක්කවල “2030 න්‍යාය පත්‍රයට” අනුකූල විය යුතුය. |